**මන්නාරම නගර සභාව**

**------------------------**

**මන්නාරමදිස්ත්‍රික්කය**

**----------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 20**20**පෙබරවාරි **28** දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර**,**එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2020 ජූනි 17 දින හා 2020 අගෝස්තු 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මන්නාරම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ------------------------ | ---------------------------- | ------------ |
| (i) | සමාලෝචිත වර්ෂයේදී නගර සභාව විසින් ගෙවිය යුතු උසාවි දඩ රු.4,401,606 ක් හා මුද්දර ගාස්තු රු.13,886,820 ක් ආදායම් හා වියදම් ගිණුමේ දක්වා තිබුණි. එකතු වටිනාකම වූ රු.18,288,426 ක් මහජන ණයගැති ගිණුමේ ඇතුළත් කිරීමෙන් තොරව පහත සඳහන් ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. | මෙය 2020 වර්ෂය සඳහා වන අවසාන ගිණුම් වල ජර්නල් හරහා ගැලපීම් කරනු ලැබේ. | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායමේ ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතුය. |
| * | වර්ෂය තුළ නගර සභාවවිසින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කළ රු.10,000,000 ක් ප්‍රාග්ධන වියදම් ලෙස පෙන්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල එකතුව අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ10,000,000 ක්වූ ස්ථාවර තැන්පතු සාවද්‍ය ලෙස අයභාර වියදම්වල සටහන්වීම නිසා ප්‍රාග්ධන වියදම් වැඩියෙන් දක්වා නොතිබුණු අතර2020 දී නිවැරදි කරනු ඇත. | |

| | | | |
|---|---|---|---|
| * | LGIIP ව්‍යාපෘතිය යටතේ ලැබුණු ටිපර්, රෝලර්, JCBයන්ත්‍රවලින් ලැබුණු ආදායම වූ රු.5,197,263 ක් ආදායම් ගිණුමේ දක්වා නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදල් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ ටිපර්, රෝලර්, JCP වැනි වාහන 03 කින් ලැබුණු රු.5,197,263 ක ආදායමක් වැරදීමකින් ආදායම් හා වියදම් ගිණුමේ පෙන්වා නොතිබීම හේතුවෙන් ආදායම අඩුවෙන් දක්වා ඇත. | |
| * | PSDG ව්‍යාපෘතිය හරහා ලැබුණු රු.3,037,162 ක් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ සටහන් නොවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි. | PSDG ව්‍යාපෘතිය මගින් රු.3,037,162 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණි. එය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට ඇතුළත් කර ඇති නමුත් වැරදීමකින් ආදායම් වියදම් ගිණුමට ඇතුළත් කිරීම අතපසුවීම නිසා ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | |
| * | ආපසු ගෙවිය යුතු රු.54,000 ක තැන්පතුව ජංගම ගිණුමෙන් ඉවත් කර තිබුණි. | වටිනාකම රු.54,000.00 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතුවක් විවිධ තැන්පතු ගිණුමට ඇතුළත් කර නොමැත. | |
| (ii) | මහජන උපයෝගිතා සේවා යටතේ කුලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ රු.21,696,392 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.21,696,393 ක් වූ කුලී ආදායම, ආදායම් හා වියදම් ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණු අතර බලපත්‍ර ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අනාගතයේදී එවැනි වැරදි සිදු නොවන බව කරුණාවෙන් ඔබට දන්වමි. | අදාල ආදායම් ශීර්ෂය යටතේ අදාල ආදායම් පෙන්විය යුතුය. |
| (iii) | වටිනාකම රු.10,000,000 ක් වූ ආයුර්වේද ඖෂධඋද්‍යානය පිහිටි ඉඩම හා ගෙඩනැගිල්ල නගර සභාවට අයත් නොවුවද මූල්‍ය ප්‍රකාශනවල වත්කම්වලට ඇතුළත් කර තිබුණි. | 2020 ගිණුම් වලින් ප්‍රශ්ණගත ඉඩම ඉවත් කිරීමට පියවර ගෙන ඇති බව ඔබට දන්වනු කැමත්තෙමි. | සභාවට අයත් දේපල පමණක් ස්ථාවර වත්කම්වලට ඇතුළත් කළ යුතුය. |

## 1.4 අනුකූල නොවීම

-------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 371 | වසර හතක කාලයක් තුළ නිරවුල් නොකළ රු.1,548,818 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | නිරවුල් නොකළ අත්තිකාරම් 07 ක් පියවීමට පියවර ගෙන තිබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. |
| | මුදල් රෙගුලාසි 571 | වසර දෙකේ සිට වසර හතරකට වැඩි කාලයක් ඉකුත් වූ රු.261,233 ක කොන්ත්‍රාත් ඇප තැන්පතු සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉකුත් වූ තැන්පතු ආදායමට මාරු කිරීමට පියවර ගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.52,657,844 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.54,345,454 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු  ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 17,100,000 | 13,896,335 | 22,891,378 | 17,055,000 | 18,329,289 | 18,867,241 |
| කුලී | 40,852,750 | 21,399,408 | 4,238,289 | 28,269,300 | 37,065,155 | 5,309,954 |
| බලපත්‍ර ගාස්තු | 1,160,000 | 23,269,501 | - | 1,340,000 | 1,422,159 | - |
| වෙනත් ආදායම් | 21,635,000 | 31,458,963 | 4,886,817 | 18,086,500 | 26,508,501 | 23,550,648 |
| | **80,747,750** | **90,024,207** | **32,016,574** | **64,750,800** | **83,325,104** | **47,727,843** |

### 2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාවට අයත් ගොඩනැගිල්ලක් කුලියට දීම වෙනුවෙන් සතොස වෙළඳ මධ්‍යස්ථානයෙන් වසර 05 කට අධික කාලයක සිට අයවිය යුතු හිඟ කුලී වටිනාකම වූ රු.138,290 ක් අයවී නොතිබුණු අතර අයකර ගැනීමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ ඇත. | දිගු කලක සිට හිඟ හිට ඇති කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය . |

### 2.2.3 වරිපනම්හාබදු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 255 පරිච්ඡේදයේ 160 වගන්තිය ප්‍රකාරව,නගර සභා බල සීමාව තුල වූ ඉඩම්, ඉදිකරන ලද නිවාස හා ගොඩනැගිලි සඳහා එකතු වටිනාකම රු.19,700,961 ක වරිපනම් හා බදු අය කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කර ඇත. | දිගු කලක සිට හිඟ හිට ඇති වරිපනම් හා බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**(අ) උසාවිදඩ**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් රු.4,751,854 ක උසාවි දඩ මුදලක් අයවිය යුතුව තිබුණි. | අයකර ගැනීමට කටයුතු කර ඇත. | නියමිත කාල සීමාව තුළ උසාවි දඩ අය කර ගැනීමට පියවර ගත යුතුය. |

**(ආ) මුද්දරගාස්තු**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් රු.18,423,479 ක මුද්දර ගාස්තු මුදලක් අයවිය යුතුව තිබුණි. | අයකර ගැනීමට කටයුතු කර ඇත. | නියමිත කාල සීමාව තුළ මුද්දර ගාස්තු අය කර ගැනීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

සුභසාධනය, පහසුකම්, මහජනතාවගේ සෞඛ්‍ය සම්පන්න පරිසරය, පොදු පහසුකම් සහ පොදු මහාමාර්ග, මහජන සෞඛ්‍ය සම්බන්ධ කරුණු විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි නගර සභා ආඥාපනතේ 4 වගන්තිය ප්‍රකාරව සභාව විසින් ඉටු කළ යුතු යුතුකම් සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

**තිරසාර සංවර්ධන අරමුණු**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක. General No.2018/61 දරන විගණකාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව සාගර හා සාගර සම්පත් ආරක්ෂා කරන අතරම තිරසාර සංවර්ධනය සඳහා තිරසාර දැනුවත්භාවය සහ සමුද්‍රීය හා සමුද්‍ර දූෂණය පාලනය කිරීමේ සැලසුම් සකස් කර නොතිබුණි. | **පියවර ගෙන ඇත.** | තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2 කළමනාකරණඅකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් හරක් මස් කඩය, දෛනික වෙළඳපොල, වාහන රථගාල සහ නවීන මත්ස්‍ය වෙළඳපොල බදුදීම තුලින් වසර දහහතරකට අධික කාලයක සිට හිඟහිටි රු.1,791,696 ක බදු මුදල් අයකර ගැනීමට කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කර ඇත. | නියමිත කාල සීමාව තුළ ආදායම අය කර ගැනීමට පියවර ගත යුතුය. |

**3.3 මානවසම්පත්කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **පුරප්පාඩු සහ අතිරික්ත** | | |
| | සභාවේ සාමාජිකයින් 15 දෙනෙකුගේ පුරප්පාඩු පුරවා නොමැති අතර එම පුද්ගලයින් විසින් සිදු කළ කාර්යයන් කෙරෙහි බලපෑම් ඇති විය. | පියවර ගෙන ඇත. | අදාල කාල සීමාව තුළ පුරප්පාඩු පිරවීම සඳහා සභාව සුදුසු පියවර ගත යුතුය. |
| (ආ) | **සේවක ණය** | | |
| (i) | මන්නාරම් නගර සභාවේ ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීම, සේවය අත්හිටුවීම සහ සේවයෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් වසර හතරකට වැඩි කාලයක සිට සේවකයින් 05 දෙනාගෙන් අය කළ යුතු රු.421,454 ක ණය සම්බන්ධයෙන් සභාව විසින් ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | අදාළ සේවකයින්ගේ පාරිතෝෂිකයෙන් අය කිරීමට පියවර ගෙන තිබේ. | නියමිත කාල සීමාව තුළ සේවක ණය හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරියෙකුගේ රු.191,862 ක හිඟ ශේෂයක් වර්තමාන සේවයේ යෙදී සිටින අයගේ ලැයිස්තුවේ දක්වා තිබුණි. | හිඟ මුදල් දැනට සේවය අත්හිටවූ ලැයිස්තුවට එකතු කර ඇත. | අදාල වර්ගීකරණය යටතේ ණය ශේෂයන් පෙන්විය යුතුය. |

**(ඇ) සේවක ඇප තැන්පතු**

| | | | |
|---|---|---|---|
| (i) | 2017 මාර්තු 04 දිනැති අංක. PF/01/2017 දරන පළාත් මුදල් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරවඇප තැන්පතු ගෙවා වෙනත් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට මාරු වන නිලධාරියා සම්බන්ධ සම්පූර්ණ තොරතුරු හා ලිපි ලේඛන අදාළ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, නිලධාරීන් 03 කගේ තොරතුරු විවිධ හේතූන් මත නගර සභාවෙන් යවා නොතිබුණි. | නිලධාරීන්ගේ සේවක ඇප තැන්පතු සම්බන්ධයෙන් පියවර ගන්නා බවත්, ගිණුම් වලින් නිවැරදි කරන බවත් කරුණාවෙන් දන්වමු. | චක්‍රලේඛයට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | 2017 මාර්තු 04 දිනැති අංක. PF/01/2017 දරන පළාත් මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, නිලධාරීන් විසින් ගෙවිය යුතු අවම සේවක ඇප තැන්පතුව රු.317,500 ක් වන නමුත් රු.185,000 ට වඩා අඩු මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | 2017 මාර්තු 04 දිනැති අංක: PF/01/2017(a) චක්‍රලේඛය ප්‍රකාරව එම මුදල අය කර ගැනීමට පියවර ගෙන ඇති බව කරුණාවෙන් ඔබට දන්වමි. | චක්‍රලේඛයට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 වත්කම්කළමනාකරණය

### 3.4.1 නඩත්තුහාඅළුත්වැඩියාකිරීමටඅසමත්වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් වාහන 12 ක් වසර පහකට වැඩි කාලයක් අලුත්වැඩියා කිරීමට සිදු වූ නමුත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අළුත්වැඩියා කළ හැකි වාහන 12 න් එකක් අළුත්වැඩියා කර භාවිතා කරන බවත් අලුත්වැඩියා කළ නොහැකි අනිකුත් වාහන ඉවත් කිරීමට පියවර ගනිමින් සිටින බවත් ඔබට දන්වන්න කැමත්තෙමි. | වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතුය. |

### 3.4.2 අත්පත්කරනොගත්වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.8,188,000 ක් වූ වාහන 06 ක අයිතිය පැවරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.ඒවා සභාව විසින් භාවිතා කරනු ලැබේ. | අයිතිය පැවරීමට පියවර ගත යුතුය. | වාහනවල අයිතිය සභාවට පැවරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් භාවිතා කරනු ලබන වටිනාකම රු.31,100,000 ක් වූ ගොඩනැගිලි තුනකට අදාල ඉඩම් අයිතිය පවරා ගැනීමට කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | පියවර ගත යුතුය. | ඉඩමෙහි අයිතිය තහවුරු කරන ලෙස මන්නාරම ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් කර තිබේ. ඉඩම්වල අයිතිය සභාවට පැවරිය යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවයහායහපාලනය**

----------------------------------------

**4.1** **අයවැයපාලනය**

--------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ සභාවේ පොලී ගෙවීම් සියයට 237 කින් සහ ගොඩබෑමේ සබැඳිය ඇස්තමේන්තුගත පිරිවැය සියයට 50 කින් ඉක්මවා ගොස් තිබීමෙන් ඇස්තමේන්තුගත වියදමට වඩා තත්‍ය වියදම් ඉක්මවා ඇති බව පෙන්නුම් කරන අතර එයින් අයවැය සකස් කිරීමේ අකාර්යක්ෂමතාවය අනාවරණය විය. | අනාගතයේ දී අයවැය සකස් කරන විට එය සැබෑ පිරිවැය සහ අයවැය අතර වෙනසක් නොමැති අයුරින් සකස් කරනු ලැබේ. | අයවැය නිසි ක්‍රමවේදයක් අනුව සකස් කළ යුතුය. |